එකම වරදක් සඳහා කාන්තා සහ පිරිමි දෙපාර්ශවයම සහභාගි වූ විටකදී පවා, ඇතැම් මාධ්‍ය විසින් කාන්තාව පමණක් ඉස්මතු කිරීමේ මාධ්‍ය භාවිතය කෙතරම් යෝග්‍යද යන්න Ethics Eye අපි මින් පෙර ද සංවාදයට ඉදිරිපත් කොට ඇත්තෙමු.

මෙයට නිදසුනක් ලෙසට, දැනට මාස කිහිපයකට පෙරාතුව, පැහැරගෙන පහරදී පමුණුවිල පොදු සුසාන භූමිය අසල දමා ගොස් සිටි, අනතුරුව රෝහල් ගත කිරීමෙන් පසු මියගිය තරුණයාගේ ඝාතනය සම්බන්ධයෙන්, පස් දෙනෙකුගේ කණ්ඩායමක් අත්අඩංගුවට ගැනීමේ සිදුවීම අද පුවත්පත (සැප්තැම්බර් 18, 2023) දක්වා ඇති ආකාරය නිරීක්ෂණය කළ හැක.

සිරස්තලය තුළ ඒ සම්බන්ධයෙන් දැක්වෙන්නේ පහත අයුරිනි.

"කතුන් දෙදෙනකු ඇතුළු 5ක් අත්අඩංගුවට"

ඔබ සිතන ලෙසට,

1) මෙම ඝාතනයට කාන්තා සහ පිරිමි පස්දෙනෙකු හවුල් බවට සැකපිට අත්අඩංගුවට ගෙන තිබියදී, සිරස්තලය තුළ කාන්තාව පමණක් ඉස්මතු කෙරී ඇත්තේ මන්ද?

2) මෙසේ වරදකදී කාන්තාව පමණක් සෘණාත්මකව ඉස්මතුකර දැක්වීම ඔස්සේ, ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාව කොන් වීමක්ද සිදු නොවන්නේද?

